# බුද්ධ ධර්මය

## 1 ශ්‍රේණිය



The National e-learning Portal for The General Education

Start Your Learning Journey with e-thaksalawa

Copyright © www.e-thaksalawa.moe.gov.lk

# 27 පාඩම
# යහපත් වචන මිහිරියි



මේ පාඩම්වලින් ඔබේ දරුවාට යහපත් පෞරුෂයක් ගොඩනගා ගැනීමට අවශ්‍ය පදනම ලබාදීමට අපේක්ෂා කෙරේ.

අන්තර්ගතය :- දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පරිගණක පිටු සැකසුම :- ඒ.එම්.එස්. උත්පලා ගුණවර්ධන - පු/සාන්ත ඇන්ඩෲ මධ්‍ය මහා විද්‍යාලය පුත්තලම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

**දෙමව්පියනි/වැඩිහිටියනි,**

බුද්ධ ධර්මය 1 ශ්‍රේණිය පෙළ පොත භාවිත කරමින් දරුවා මෙම ක්‍රියාකාරකම් වල නිරත කරවන්න. දුෂ්කරතා දැක්වුවහොත් දරුවාට උදව් කරන්න.

## ක්‍රියාකාරකම 1

- පහත සඳහන් වැකි කියවන්න.
- එම වැකිවල ඇතුළත් හොඳ වැඩ තෝරන්න.
- හොඳ වැඩ ඇතුළත් වැකි අභ්‍යාස පොතේ ලියන්න.

| | |
|---|---|
| බුදුන් වඳිමු. | සතුන් නොමරමු. |
| සොරකම් කරමු. | |
| ආදරයෙන් කතා කරමු. | මල් පූජා කරමු. |
| සතුන්ට හිංසා කරමු. | |
| හොඳ වචන කතා කරමු. | |

## ක්‍රියාකාරකම 2

1.රාහුල පොඩි හාමුදුරුවෝ කතාව මතකයෙන් ශබ්ද නඟා කියන්න.
2.රාහුල පොඩි හාමුදුරුවන්ගේ චරිතයේ හොඳ ගතිගුණ දෙකක් කියන්න.
3.රාහුල පොඩි හාමුදුරුවෝ චිත්‍රයට නඟන්න.

අන්තර්ගතය :- දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පරිගණක පිටු සැකසුම :- ඒ.එම්.එස්. උත්පලා ගුණවර්ධන - පු/සාන්ත ඇන්ඩෲ මධ්‍ය මහා විද්‍යාලය පුත්තලම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ක්‍රියාකාරකම 3

1. සාම කුමරුගේ කතාව මතකයෙන් කියන්න.
2. සාම කුමරුගේ යහළුවන් දෙදෙනෙක් නම් කරන්න.
3. සාම කුමාරයා සතුන්ට ආදරය කරන අයුරු චිත්‍රයට නඟන්න.

## ක්‍රියාකාරකම 4

1. " සාධු වාචාය සංවරෝ" වැකිය පාට පැන්සලෙන් ලොකු අකුරින් අභ්‍යාස පොතේ ලියා ශබ්ද නඟා කියවන්න.

2. පහත සටහන බලන්න. හොඳ වචන කතා කරන අයට සහ නරක වචන කතා කරන අයට සිදු වන දේ වැඩිහිටියෙකුගේ උදව්වෙන් වෙන් කර හඳුනා ගන්න.

- සතුටින් ඉන්න පුළුවන්.
- දුක් විඳින්න සිදු වෙනවා.
- නිතරම කරදර සිදු වෙනවා.
- කවුරුත් ආදරය කරනවා.
- කවුරුත් ප්‍රශංසා කරනවා.
- කවුරුවත් කැමති නැහැ.
- කවුරුවත් ආදරේ නැහැ.
- කවුරුත් කැමතියි.

අන්තර්ගතය :- දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පරිගණක පිටු සැකසුම :- ඒ.එම්.එස්. උත්පලා ගුණවර්ධන - පු/සාන්ත ඇන්ඩෲ මධ්‍ය මහා විද්‍යාලය පුත්තලම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

3. පහත කවි ශබ්ද නඟා තාලයට ගායනා කරන්න.

රාහුල පොඩි සාදු වගේ
සාම කුමාරයා වගේ
හොඳ ම වචන කතා කරන
හොඳ ළමයෙක් මං

උදේ සවස බුදුන් වඳින
සතුන්ට හිංසා නොකරන
හොඳ ම වචන කතා කරන
හොඳ ළමයෙක් මං

ගුරුතුමියට කීකරු වෙන
මවුපියන්ට උදව් කරන
හොඳ ම වචන කතාකරන
හොඳ ළමයෙක් මං

ආච්චි සීයා පවසන
හොඳ හොඳ රස කතා අහන
හොඳ ම වචන කතා කරන
හොඳ ළමයෙක් මං

**<u>ක්‍රියාකාරකම 5</u>**

1. නන්දිවිසාල ජාතකයේ ඔබේ සිත්ගත් කොටසක් මතකයෙන් කියන්න.
2. නන්දිවිසාල ගවයා කරත්ත ඇද්දේ නැත්තේ ඇයි?
3. හොඳ වැඩ ඇතුළත් වැකි සහිත මල්පෙති පාට කරන්න.





Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ක්‍රියාකාරකම 6

1. " යහපත් වචන මිහිරියි" පාඩමට අනුව හොඳ වචන කතා කළ අය කවුරුන් ද?
2. පාඩමේ සඳහන් දෙබස ශබ්ද නඟා කියවන්න.

## ක්‍රියාකාරකම 7

- **යහපත් වචන ඇතුළත් වැකිවලින් සමන්විත ගසක් නිර්මාණය කරමු.**
  - පහත වැකි කියවන්න.
    - බුදු සරණයි.
    - තෙරුවන් සරණයි.
    - නිරෝගි සුව ලැබේවා.
    - මෙහාට එන්න.
    - වාඩි වෙන්න.
    - අර බලන්න.
    - වතුර බොන්න.
    - පොත් කියවන්න.
    - මල් පූජා කරමු.
    - පන්තිය සරසමු.
    - ගුරුතුමියට සවන් දෙන්න.
    - දානය පිළිගන්වන්න.
  - ඉහත වැකි කාඩ්බෝඩ් පටිවල ලියා දෙමවුපියන්ගේ උදව්වෙන් ගසක ඉත්තක් කපා එහි එල්ලන්න.
  - එම වචන දිනපතා කියවන්න.
  - එම වැකි අභ්‍යාස පොතේ ලියන්න.

අන්තර්ගතය :- දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පරිගණක පිටු සැකසුම :- ඒ.එම්.එස්. උත්පලා ගුණවර්ධන - පු/සාන්ත ඇන්ඩෲ මධ්‍ය මහා විද්‍යාලය පුත්තලම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk

## ක්‍රියාකාරකම 8

- පහත කවි තාලයට ගායනා කරන්න. වැඩිහිටියෙකුගේ සහය ලබාගන්න.

තෙරුවන් සරණයි ඔබ හට
බුදු සරණයි ගිහින් එන්න
හොඳ වචන ම කතා කරන
හොඳ දරුවෙක් මං

ගුරුතුමියට කීකරුයි
මව්පියන්ට කීකරුයි
හොඳ වචන ම කතා කරන
හොඳ දරුවෙක් මං

සමිඳුන් දෙසූ බණ අසනා
සතුන්ට ආදරය කරන
හොඳ වචන ම කතා කරන
බොදු දරුවෙක් මං

හැමෝ ම මට ආදරෙයි
මං හැමට ම ආදරෙයි
හොඳ වචන ම කතා කරන
හොඳ දරුවෙක් මං

ඇගයීම

| | | |
|---|---|---|
| හරිම හොඳයි. |  | ✓ |

අන්තර්ගතය :- දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පරිගණක පිටු සැකසුම :- ඒ.එම්.එස්. උත්පලා ගුණවර්ධන - පු/සාන්ත ඇන්ඩෲ මධ්‍ය මහා විද්‍යාලය පුත්තලම.

Copyright © www.e-thaksalawa.moe.gov.lk